www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බලගතු නාවික සටන: ශ්‍රී ලංකාව විවෘත සිවිල් යුද්ධය දෙසට වේගයෙන් ඇදී යයි

## Major naval battle: Sri Lanka plunges towards open civil war

**කේ. රත්නායක විසිනි**
**2006 මැයි 13**

ශ්‍රී ලංකාව තුල ගැටුමේ සුවිසල් ඉහල නැග්මක් සනිටුහන් කරමින් පසු ගිය බ්‍රහස්පතින්දා උතුරේ ධීවර ගම්මානයක් වන වෙට්ටිලායිකර්නි අසල මුහුදේ දී මිලිටරිය සහ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊය) පෙනෙනාතෙක් මානයේ සිට නාවික සටනක නිරත වූහ. දෙපාර්ශ්වයෙන් 50 ට ආසන්න සංඛ්‍යාවක් මිය ගොස් ඇති බවට ගනන් බලා ඇත. මිලිටරිය එල්ටීටීඊ ප්‍රහාරයට පලිගැනීමක් ලෙස, කිලිනොච්චියේ සතුරු මූලස්ථානය ආසන්න ප්‍රදේශය ද අන්තර්ගත කොට ගත් එල්ටීටීඊ පාලිත ප්‍රදේශයන් එල්ල කර ගනිමින් ගුවන් ප්‍රහාර සහ කාලතුවක්කු ප්‍රහාර මාලාවක් දියත් කලේ ය.

ප්‍රහාරයට ආරම්භකත්වය ගැනීම සම්බන්ධයෙන් කොලඹ ආන්ඩුව සහ මාධ්‍යයන් විසින්  ක්ෂනිකව එල්ටීටීඊය හෙලා දුටු නමුදු, මෙම අවසන් සිද්ධිය සිදු වූයේ ශ්‍රී ලංකාවේ මිලිටරියේ කොටස් සමග එක්ව කටයුතු කරන එල්ටීටීඊ විරෝධී සන්නද්ධ කන්ඩායම් විසින් කරන ලද දිගු ප්‍රකෝපකරන මාලාවකට පසුව ය. එල්ටීටීඊය හා ආන්ඩුව අතර 2002දී ඇති කරගත් සටන් විරාම ගිවිසුම මෙතෙකුදු නිල වශයෙන් ක්‍රියාත්මක වන අතර දිවයිනේ උතුරු-නැගෙනහිර කලාපයන්හි කෙරී ගෙන යන අප්‍රකාශිත යුද්ධය ඉහල නගිමින් පවතී.

ශ්‍රී ලංකාවේ මිලිටරියට අනුව, සෙබලුන් 700ක් රැගත් පර්ල් ක්‍රෑස් සස නෞකාවට සහ එයට රැකවරනය ලබා දෙමින් ගමන් ගත් සංචාරක බෝට්ටු හතරකට බ්‍රහස්පතින්දා සවස් වරුවේ එල්ටීටීඊ බෝට්ටු 15කින් පහර දී ඇත. පැය දෙකක සටන තුල දී, එල්ටීටීඊයේ පුපුරන ද්‍රව්‍ය පුරවා ගත් යාත්‍රාවකින් පහර දී නාවික හමුදාවේ එක් ප්‍රහාරක බෝට්ටුවක් දියේ ගිල්වා දැමීම හේතුවෙන් නිලධාරීන් දෙදෙනෙකු ඇතුලත් නැවියන් 17 දෙනෙක් සහ යුද හමුදා සංඥාකරුවකු ජීවිතක්ෂයට පත්වූහ. නාවික හමුදාව ප්‍රකාශ කරන්නේ ගුවන් ආචාර සහිතව තම සංචාරක බෝට්ටු මගින් පහර දී එල්ටීටීඊ යාත්‍රා පහක් විනාශ කල බවත්, තවත් කීපයකට හානි සිදු කල බවත් සහ ගැටුමේ දී අවම වසයෙන් එල්ටීටීඊ සාමාජිකයන් 30 දෙනෙකුවත් මිය ගිය බවත් ය.

එල්ටීටීඊ ය නාවික හමුදාවට චෝදනා කරමින් කියා සිටින්නේ, තම මුහුදු අභ්‍යාසවලට අවහිර කරමින් නාවික හමුදාව ප්‍රකෝපකරනයේ යෙදුනු බවයි.

කෙසේ නමුදු, පර්ල් ක්‍රෑස් සස නෞකාවේ සිට නිරීක්ෂනයේ යෙදුනු නෝර්වීජියානු නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නිරීක්ෂන දූත මෙහෙය (එස්එල්එම්එම්), "ප්‍රහාරාත්මක මෙහෙයුමක්" ගෙන යාම මගින් සටන් විරාම ගිවිසුමේ "ශුද්ධ උල්ලංඝනයක්" සිදු කර ඇති බවට එල්ටීටීඊයට චෝදනා කලේ ය. නිරීක්ෂන කන්ඩායම "පක්ෂග්‍රාහී" ආකාරයෙන් ක්‍රියා කරන බවට චෝදනා කල එල්ටීටීඊය නාවික අභ්‍යාස සඳහා තමාට ඇති අයිතිය අවධාරනය කලේ ය. මින් මතුවට නාවික හමුදා යාත්‍රාවන්හි ගමන් කරමින් නිරීක්ෂන කටයුතුවල යෙදීම සම්බන්ධයෙන් නිරීක්ෂන කන්ඩායමට අනතුරු අඟවමින් එල්ටීටීඊය නිකුත් කල ප්‍රකාශයක මෙසේ සඳහන් වේ: "අපේ අනතුරු ඇඟවුම සහ ඉල්ලීම නොතකා හලොත් ප්‍රති විපාක සම්බන්ධයෙන් අපි වග නොකියන්නෙමු."

පසු ගිය නොවැම්බරයේ ජනාධිපති රාජපක්ෂගේ තේරී පත්වීමෙන් පසු ප්‍රචන්ඩත්වය ඉහල නැංවීම මධ්‍යයේ, දෙපාර්ශ්වයම මාස ගනනාවක් පුරා බලගතු ලෙස යුදමය තත්වයකට ගමන් කරමින් සිටිති. එල්ටීටීඊයේ පුද්ගලයින්ට හා ස්ථානවලට එල්ල කෙරෙන ප්‍රහාර සම්බන්ධයෙන් කවර හෝ සම්බන්ධයක් ප්‍රතික්ෂේප කිරීම ආන්ඩුවේ පුරුද්දක් වී ඇති නමුදු, වාර්ගික ආතතීන් අවුලුවා ලීම සඳහා ගෙන යනු ලබන ඝාතනවලට විවිධ දෙමල සන්නද්ධ කන්ඩායම් සමග මිලිටරිය හවුල් වන බවට සාක්ෂ්‍ය වැඩෙමින් පවතී. පෙබරවාරියේ ජිනීවාහි දී පැවැති සාකච්ඡාවල දී, යුද හමුදාව මගින් පාලනය වන ප්‍රදේශයන්හි මෙහෙයුම් කරනු ලබන සන්නද්ධ කන්ඩායම් නිරායුධ කිරීම ආවශ්‍යක කෙරෙන සටන් විරාම ගිවිසුම් වගන්තීන් ක්‍රියාවට නැංවීම සඳහා ආන්ඩුව එකඟ වූ නමුදු, මෙතෙක් එය ක්‍රියාවට නැංවී නොමැත.

පසු ගිය ප්‍රහස්පතින්දා, නිරීක්ෂන කන්ඩායමේ නිරීක්ෂක ජූනි සනිනන් රොයිටර් පුවත් සේවයට මෙසේ

ප්‍රකාශ කලේ යː "මෙම ඝාතන සඳහා අවම වසයෙන් ආන්ඩුවේ සෙබලුන්ගෙන් කොටසක් හෝ සම්බන්ධ බවට ඉතා බලගතු සාක්ෂ්‍ය අප සතුව ඇත". හමුදාවේ සෝදිසි ස්ථානයක සිට යන්තම් මීටර 60 කට දුරින්, එල්ටීටීඊයේ සාමාජිකයෙකු යැයි සැක කෙරුනු තැනැත්තකුගේ සොහොයුරිය ඝාතනය කෙරුනු ස්ථානයට ඔහු රොයිටර් සම්බන්ධීකාරකයා රැගෙන ගියේ ය. ඝාතනය සිදුවූ මොහොතේ එහි රාජකාරියේ යෙදී සිටි භටයින් තිදෙනාගෙන් නිරීක්ෂන කන්ඩායමේ පරීක්ෂක ජුක්කා හීස්කැනන් විසින් ප්‍රකාශ ලබා ගත් අතර ඔවුන් කියා සිටියේ කිසිවක් නොඇසුනු බවයි. මෙම ප්‍රකාශයන් කිසිසේත් ම විශ්වාස කල නොහැකි යැයි ඒවා ප්‍රතික්ෂේප කල ඔහු පුවත් ඒජන්සියට මෙසේ පැවසී යː "මෙය හාස්‍යජනකයි. සිද්ධිය ගැන දැන ගැනීමට හෝ ඔවුන් උත්සාහ නොදරයි."

ආන්ඩුවේ ප්‍රකාශක නිමල් සිරිපාල ද සිල්වා මෙම සතියේ දී පාර්ලිමේන්තුවට මෙසේ පැවසී යː " යාපනයේ, වවුනියාවේ සහ අවිස්සාවේල්ලේ මෑතක සිදු වූ සිවිල් වැසි ඝාතනයන් ආන්ඩුව විසින් බලගතු ලෙස හෙලා දකින අතර ඝාතකයින්ට දඬුවම් කිරීම සඳහා අත්‍යවශ්‍ය සියලු පියවර ගන්නෙමු." මෙම කියමන් ද විකාර රූපී වේ. නැගෙනහිර සහ උතුරේ යුද කලාපයන්හි, තම පාලනයට යටත්ව පවත්නා ප්‍රදේශයන්හි මිලිටරිය සහ පොලීසිය බලගතු ආරක්ෂාවක් යොදා ඇත. මෙම කලාපයන්හි දෙමල ජනයාට එරෙහි නිරන්තර හිරිහැර සහ බියවැද්දීම්වලට අමතරව "එල්ටීටීඊ සැකකරුවන් රඳවා තැබීම" සඳහා කෙරෙන පුලුල් සෝදිසි මෙහෙයුම් ද ක්‍රියාත්මක වේ. එසේ වතුදු, අතුරුදහන් වීම් සහ ඝාතන වැඩිවන තත්වයක් තුල ඊට සම්බන්ධවූවන් -- නඩු පැවරීම හෝ දඬුවම් කිරීම කෙසේ වෙතත් -- මේ වනතුරු කවරෙකු හෝ අත් අඩංගුවට ගෙන නොමැත.

පසු ගිය මාසයේ දී ජිනීවාහි දී තවත් සාකච්ඡා වටයක් පැවැත්වීමට ගත් උත්සාහයන් අසාර්ථක විය. ජපානයේ විශේෂ නියෝජිත යසුෂි අකාශි මේ සතියේ දින හතරක්ම ශ්‍රී ලංකාව තුල ගත කල නමුදු සාකච්ඡා සඳහා යලි අවතීර්න කරවා ගැනීම සඳහා ආන්ඩුව සහ එල්ටීටීඊය එකඟ කර ගැනීමට අසමත් විය. කිලිනොච්චියේ එල්ටීටීඊ මූලස්ථානයට අකාශි පැමිනි වේලේ එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන් ඔහු නොතකා හැරි අතර, දේශපාලන අංශ නායක එස්. පී. තමිල් චෙල්වම් අකාශිට කියා සිටියේ "ශ්‍රී ලංකා සන්නද්ධ බලකායන්ගේ යුධමය ආකාර ප්‍රහාර" නවතා දමන තෙක් එල්ටීටීඊය සාකච්ඡාවලට නොපැමිනෙන බවයි.

අකාශි කතා කරන්නේ ඊනියා ශ්‍රී ලංකා සාම ක්‍රියාදාමයේ සම සභාපතිත්වය දරන එක්සත් ජනපදය, ජපානය, යුරෝපා සංගමය සහ නෝර්වේ වෙනුවෙනි. මෙම සම සභාපතිත්වය රාජපක්ෂ ආන්ඩුවේ හික්මීම සම්බන්ධයෙන් ප්‍රශංසා කරන අතර තුර එල්ටීටීඊය සම්බන්ධයෙන් වඩවඩාත් තර්ජනාත්මක ආස්ථානයක් ගෙන ඇත. අකාශි විසින් කොලඹ මාධ්‍යයන්ට ප්‍රකාශයක් කරමින්, අප්‍රේල් 25 වන දා යුද හමුදා මූලස්ථානයට එල්ල කෙරුනු එල්ටීටීඊ ප්‍රහාරය හෙලා දුටුවේ "තමාගේ වගකීම් ඉක්මවා නොගිය සන්නද්ධ භටකායන් එසේ ම රඳවා තබා ගන්නා" ලෙස ආන්ඩුවට පමනක් ආයාචනා කරමිනි.

එසේ කරන ගමන්ම, ප්‍රධාන බලවතුන් විසින් එල්ටීටීඊය සම්බන්ධයෙන් වඩාත් ප්‍රකෝපකාරී ඉරියව්වක් ක්‍රියාවේ යෙදවීම සඳහා ශ්‍රී ලංකාවේ ආන්ඩුවට හා මිලිටරියට නිහඬව ඉඩ දේ. යුද්ධය නතරවූයේ නම්, ආධාර දෙන රටවල් විසින් ඩොලර් බිලියන 4.5ක "සාම භාග්‍යයක්" පරිත්‍යාග කිරීමට සූදානම්ව සිටි බව අකාශි මාධ්‍යයන්ට මතක් කලේ ය. නමුදු, එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ආන්ඩුව සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි එහි සිංහල අන්තවාදී සහායකයින් වඩ වඩාත් යුද්ධය කෙරෙහි සමාහිත විය. සාමයේ මිනිසෙකු ලෙස රාජපක්ෂගේ පෙනී සිටීම තුල ඉන් වැඩි කොටසක් එල්ල වී පවත්නේ එල්ටීටීඊය ආක්‍රමනිකයකු (කලහකරුවකු) ලෙස පින්තාරු කොට එය මිලිටරිමය වසයෙන් විනාශ කිරීමට ජාත්‍යන්තර සහාය ගොනු කර ගැනීම සඳහා ය.

අගමැති මන්මෝහන් සිං ඇතුලු ජ්‍යෙෂ්ඨ ඉන්දීය නායකයින් සමග සාකච්ඡා වටයක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශ ඇමති මංගල සමරවීර පසු ගිය සති අන්තයේ නව දිල්ලියට පැමිනියේ ය. නැවත සාකච්ඡාවලට එන ලෙස එල්ටීටීඊයට කියන්නැයි ඉන්දියාවෙන් ප්‍රසිද්ධියේ ඉල්ලා සිටින අතර තුර, සමරවීරගේ දූත ගමනේ එක් ප්‍රධාන අරමුනක් වූයේ දෙරට අතර ආරක්ෂක ගිවිසුමක් අත්සන් කිරීම සඳහා ඉන්දියානු ආන්ඩුව පොලඹවා ගැනීම යි. 2003 දෙසැම්බරයේ දී, එවකට මිලිටරියේ අනදෙන නිලධාරී ලෙස සිටි ජෙනරාල් ලයනල් බලගල්ල විසින් ගිවිසුමේ අඩංගු කරුනු කාන්දු කලේ ය. එල්ටීටීඊය පරාජය කිරීම සඳහා ශ්‍රී ලංකා මිලිටරියේ ධාරිතාව සැලකියයුතු ආකාරයෙන් වැඩි කිරීමට තුඩු දෙන රහස් තොරතුරු, ගුවන් සහාය සහ ඒකාබද්ධ නාවික මෙහෙයුම් වැනි ක්ෂේත්‍රයන්හි පුලුල් මිලිටරි සහයෝගිතාව සඳහා වන සැලසුම් එමගින් අනාවරනය විය.

එල්ටීටීඊයට සහයෝගය දක්වන තමිල්නාඩු දකුනු ඉන්දීය ප්‍රාන්ත රාජ්‍යයේ පක්ෂවල විරුද්ධත්වය හමුවේ ගිවිසුම ප්‍රමාද කෙරින. තමිල්නාඩුවේ දේශපාලනය සාධකයක්ව පැවතියදීම, ඉන්දියානු ආන්ඩුව එල්ටීටීඊයට සතුරුවන අතර, එල්ටීටීඊයේ කවර හෝ ජයග්‍රහනයක් කලාපය තුල අස්ථාවරකාරක බලපෑමක් සිදු කරනු ඇතැයි භීතව සිටී. වාර්තාවන්ට අනුව සමරවීර ඉන්දියානු ආරක්ෂක ඇමති ප්‍රනාබ් මුකර්ජි සමග ගිවිසුම සම්බන්ධයෙන් පසු ගිය සති අන්තයේ දී සාකච්ඡා

කොට ඇති නමුදු ඒ සම්බන්ධයෙන් පොරොක්දුවක් දී නොමැත. විධිමත් ගිවිසුමක් නොමැති වුවද, ඉන්දියානු මිලිටරිය නිසැකවම තම ශ්‍රී ලාංකික ප්‍රතිරූපකයන් සමග සහයෝගීව කටයුතු කරමින් සිටී. බ්‍රහස්පතින්දා සටන් දර්ශකය අසල, එල්ටීටීඊයේ යාත්‍රා බිය ගැන්වීම සඳහා ඉන්දියානු යුධ නැව් පෙනී සිටින්නට ඇතැයි ඉන්දියානු පුවත්පත් පවා ඊයේ පෙන්නුම් කලේ ය.

එල්ටීටීඊය සමග යුද්ධයක් සඳහා උද්ඝෝෂනය කරන ජවිපෙ මත නොකඩවා රඳා පැවැත්ම මගින් රාජපක්ෂගේ සාමය පිලිබඳ ප්‍රසිද්ධ කථාවන්හි ව්‍යාජ ස්වභාවය වඩාත් පැහැදිලිව එලිමහනට පැමිනේ. රටේ හදිසි නීතිය දික් කිරීම සඳහා මෑතකදී කෙරුනු පාර්ලිමේන්තු විවාදයක දී ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශ මෙසේ පැවසී යː " අප ත්‍රස්තවාදී අභියෝගය දෙස අවධානය යොමු කල යුතුයි. ඔවුන් දූනටමත් හතරවන ඊලම් යුද්ධය යුද්ධය ආරම්භ කරලා. අපිට ඔවුන්ගේ භාෂාවෙන් ඔවුන්ට පිලිතුරු දීමට සිදුව ඇත. සියලු (පක්ෂ) දෙනා මේ ව්‍යායාමයේ දී එකට එක් විය යුතුයි. වෙනත් විකල්පයක් නොමැත."

ඉන් අනතුරුව, ජවිපෙ සන්ධානගතව සිටින දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ රැස්වීමක් අමතා ඔහු මෙසේ පැවසී යː "කොටි සංවිධානය විසින් ශ්‍රී ලංකා මාතෘ භූමිය බෙදීමේ අද්දරටම ගෙන ගොස් හා හතරවන ඊලම් යුද්ධයට රට ඇද දමා තතු යටතේ ඔවුන් මිලිටරිමය වසයෙන් පරාජය කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත." සාකච්ඡාමය විසඳුමක් සඳහා නොකඩවා කතා කිරීමේ දී "ජාත්‍යන්තර ප්‍රජාව" නැලවීමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් ඔහු ආන්ඩුව විවේචනය කලේ ය.

ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතය සහ මිලිටරිය විසින් රට නැවතත් ව්‍යසනකාරී සිවිල් යුද්ධයකට ඇද දැමීම සඳහා සූදානම් වන නමුදු, දූනටමත් ජීවිත 65,000කින් වන්දි ගෙවා ඇති මෙම ගැටුම නැවත ආරම්භ කිරීමක් ජනගනයෙන් බහුතරයකට අවශ්‍ය නොවේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) යුධ එලැඹුමකට නොකඩවා විරුද්ධ වී ඇති අතර, තම පන්ති අවශ්‍යතා සඳහා සටන් කරනු වස් සමාජවාදී පිලිවෙත් මත පදනම්වූ ස්වාධීන ව්‍යාපාරයක් තුල සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරුවන් එකමුතු කිරීමට දේශපාලනිකව සටන් කොට ඇත. සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් විසින් "ශ්‍රී ලංකාවේ යුධ අන්තරායට සමාජවාදී විසඳුමක්" යනුවෙන් නිකුත් කරන ලද ප්‍රකාශයෙන් මතු කරන ලද කරුනු සාවධානව සලකා බලන ලෙස අපි අපේ පාඨකයින්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org